# ක්‍රියාපද පිරික්සුම් ලැයිස්තුව (Action Verbs)

| දැනුම් ක්‍රියාවලිය<br>**(Knowledge Process)** | ක්‍රියාපද ලැයිස්තුව<br>**(Verb List)** | ක්‍රියාපද නිර්වචන<br>**(Verb Definitions)** |
|---|---|---|
| **පළමු ස්ථරය -<br>මතක තබා ගැනීම**<br>වැදගත් තොරතුරු මෙනෙහි කිරීම<br><br>**Tier 1 - Remember**<br>Recall important information | **නිර්වචනය කරන්න<br>Define** | ස්වභාවය, විෂය පථය හෝ අර්ථය තත්ත්වාකාරයෙන් විස්තර කිරීම.<br>Describe exactly the nature, scope or meaning |
| | **අඳින්න<br>Draw** | පින්තූරයක් හෝ රූප සටහනක් ගෙනහැර දැක්වීම.<br>Produce (a picture or diagram) |
| | **හඳුනා ගන්න<br>Identify** | සලකා බැලීමෙන් පසුව හඳුනාගැනීම, තහවුරුකිරීම හෝ තෝරාගැනීම.<br>Recognise, establish or select after consideration |
| | **ලැයිස්තුගත කරන්න<br>List** | එකිනෙකට සම්බන්ධ කරුණු හෝ අයිතම එකින් එක ලිවීම.<br>Write the connected items one below the other |
| | **සම්බන්ධතාවය ගෙනහැර දක්වන්න<br>Relate** | තර්කානුකූල හෝ හේතුකාරක සම්බන්ධතා තහවුරු කිරීම.<br>To establish logical or causal connections |
| | **සඳහන් කරන්න<br>State** | යමක් නියත වශයෙන්ම හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම.<br>Express something definitely or clearly |
| **දෙවන ස්ථරය -<br>අවබෝධ කර ගැනීම**<br>වැදගත් තොරතුරු පැහැදිලි කිරීම.<br><br>**Tier 2 - Comprehension**<br>Explain important information | **ගණනය කරන්න<br>Calculate/Compute** | ගණිත ක්‍රම භාවිතයෙන් ගණනය කිරීම.<br>Make a mathematical computation |
| | **සාකච්ඡා කරන්න<br>Discuss** | නිගමනයන් කරා එළඹීමේ අරමුණු ඇතිව,තර්ක මගින් පෙන්වන විවිධ පැතිකඩ ඔස්සේ සවිස්තරාත්මකව පරීක්ෂා කිරීම.<br>Examine in detail by argument showing different aspects, for the purpose of arriving at a conclusion |
| | **පැහැදිලි කරන්න<br>Explain** | අදාළ කරුණු අනාවරණය කරමින් සවිස්තරාත්මකව පැහැදිලි කිරීම.<br>Make a clear description in detail revealing relevant facts |
| | **අර්ථ දක්වන්න<br>Interpret** | වටහාගත හැකි අයුරින් ඉදිරිපත් කිරීම හෝ පරිවර්තනය කිරීම.<br>Present in understandable terms or to translate |
| | **පෙන්වා දෙන්න<br>Recognise** | වලංගුතාවය පෙන්වීම, දැනුම හෝ පළපුරුද්ද භාවිතා කිරීම.<br>To show validity or otherwise, using knowledge or contextual experience |
| | **වාර්තා කරන්න<br>Record** | විස්තරාත්මකව අදාළ සටහන් ඇතුලත් කිරීම.<br>Enter relevant entries in detail |
| | **සාරාංශගත කරන්න<br>Summarise** | ප්‍රධාන කරුණු සඳහා අදාළ කෙටි විස්තරයක් ලබාදීම (කරුණු හෝ සංඛ්‍යා).<br>Give a brief statement of the main points (in facts or figures) |

| දැනුම් ක්‍රියාවලිය<br>(Knowledge Process) | ක්‍රියාපද ලැයිස්තුව<br>(Verb List) | ක්‍රියාපද නිර්වචන<br>(Verb Definitions) |
|---|---|---|
| **තුන්වන ස්ථරය -<br>භාවිතා කිරීම**<br>ඉගෙනුම් පරිසරයෙන් පරිබාහිරව දැනුම පාවිච්චි කිරීම/සංවෘත ගැටළු විසඳීම.<br><br>**Tier 3 - Application**<br>Use knowledge in a setting other than the one in which it was learned/solve close-ended problems | **අදාළ කරන්න<br>Apply** | ප්‍රායෝගික භාවිතය සඳහා යෙදවීම.<br>Put to practical use |
| | **තක්සේරු කරන්න<br>Assess** | අගය, ස්වාභාවය, හැකියාව හෝ ගුණාත්වය තීරණය කිරීම.<br>Determine the value, nature, ability or quality |
| | **නිදර්ශනය කරන්න<br>Demonstrate** | විශේෂයෙන් උදාහරණ මගින් සනාථ කිරීම.<br>Prove, especially with examples |
| | **ප්‍රස්ථාරගත කරන්න<br>Graph** | ප්‍රස්ථාරයක් උපයෝගී කරගෙන නිරූපණය කිරීම.<br>Represent by means of a graph |
| | **සූදානම් කරන්න<br>/පිළියෙළ කරන්න<br>Prepare** | යම් විශේෂිත අරමුණක් උදෙසා සූදානම් වීම.<br>Make ready for a particular purpose |
| | **ප්‍රමුඛගත කරන්න<br>Prioritise** | වැදගත්කම අනුව සැකසීම හෝ පෙළගැස්වීම.<br>Arrange or do in order of importance |
| | **සසඳන්න<br>Reconcile** | යම් දෙයක් සමග අනුරූපගත කිරීම.<br>Make consistent with another |
| | **විසඳන්න<br>Solve** | ගණනය කිරීම තුලින් හෝ පැහැදිලි කිරීම තුලින් විසඳුමක් සොයා ගැනීම.<br>To find a solution through calculations and/or explanations |
| **සිව්වන ස්ථරය -<br>විශ්ලේෂණය කිරීම**<br>අදහස් අතර සම්බන්ධතා උකහා ගැනීම සහ සන්සන්දනය සහ විසංසන්දනය/විවෘත ගැටළු විසඳීම.<br><br>**Tier 4 - Analysis**<br>Draw relations among ideas and to compare and contrast/solve open-ended problems | **විශ්ලේෂණය කරන්න<br>Analyse** | ප්‍රතිඵලයක් හෝ විසඳුමක් නිශ්චය කිරීම උදෙසා විස්තරාත්මකව පරීක්ෂා කිරීම.<br>Examine in detail in order to determine the solution or outcome |
| | **සංසන්දනය කරන්න<br>Compare** | සමානාත්මතා අනාවරණය කිරීමේ අරමුණින් විභාග කිරීම.<br>Examine for the purpose of discovering similarities |
| | **වෙනස පෙන්වා දෙන්න/අසමානතා දක්වන්න<br>Contrast** | වෙනස්කම් හෝ අසමානතා පරීක්ෂාකිරීම.<br>Examine in order to show unlikeness or differences |
| | **වෙන්කොට<br>හඳුනා ගන්න<br>Differentiate** | කිසියම් දෙයක් පැහැදිලිව වටහා ගත හැකි ආකාරයට වෙනසක් සංස්ථාපනය කිරීම.<br>Constitute a difference that distinguishes something |
| | **කෙටියෙන් දක්වන්න<br>Outline** | විශේෂ ලක්ෂතා ඇතුලත් සාරාංශයක් සැකසීම.<br>Make a summary of significant features |

| දැනුම් ක්‍රියාවලිය<br>(Knowledge Process) | ක්‍රියාපද ලැයිස්තුව<br>(Verb List) | ක්‍රියාපද නිර්වචන<br>(Verb Definitions) |
|---|---|---|
| **පස්වන ස්ථරය - ඇගයීම**<br>ක්‍රමවේද , අදහස්, පුද්ගලයන් හෝ නිෂ්පාදිතයන්හි අගය විනිශ්චි සහ තීරණය කිම.<br><br>**Tier 5 - Evaluate**<br>Formation of judgments and decisions about the value of methods, ideas, people or products | **උපදෙස් දෙන්න**<br>**Advise** | ප්‍රතිග්‍රාහකයාට ගැලපෙන අයුරින් වඩාත් සුදුසු ක්‍රියාමාර්ගයන් ඉදිරිපත් කිරීම.<br>Offer suggestions about the best course of action in a manner suited to the recipient |
| | **ඒත්තු ගන්වන්න**<br>**Convince** | සාක්ෂි හෝ තර්ක භාවිතා කරමින් යමක් විශ්වාස කිරීම සඳහා අන්‍යයන් පෙළඹවීම.<br>To persuade others to believe something using evidence and/or argument |
| | **විවේචනය කරන්න**<br>**Criticise** | යම් විනිශ්චයක් ඇතිකිරීම හා ප්‍රකාශ කිරීම.<br>Form and express a judgment |
| | **අගයන්න**<br>**Evaluate** | සැලකිලිමත් තක්සේරු කිරීමක් තුලින් වැදගත්කම නිවැරදිව තහවුරු කිරීම.<br>To determine the significance by careful appraisal |
| | **නිර්දේශ කරන්න**<br>**Recommend** | වඩාත් සුදුසු ක්‍රියාමාර්ගය උදෙසා යෝජනා ඉදිරිපත් කිරීම.<br>A suggestion or proposal as to the best course of action |
| | **නිශ්චය කර විසඳන්න**<br>**Resolve** | ගැටළුවක් හෝ විවාදශීලී කරුණු සඳහා විසඳුම් සොයාගැනීම හෝ සමතයට පත්කිරීම.<br>Settle or find a solution to a problem or contentious matter |
| | **තහවුරු කරන්න**<br>**Validate** | නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම හෝ ඔප්පු කිරීම.<br>Check or prove the accuracy |
| **හයවනස්ථරය - සංශ්ලේෂණයකිරීම**<br>අනන්‍ය හෝ නව්‍ය විසඳුම් සාධනය උදෙසා විවිධ පැතිකඩයන් ඒකාබද්ධ කිරීම තුළින් නුහුරු ගැටළු විසඳීම.<br><br>**Tier 6 - Synthesis**<br>Solve unfamiliar problems by combining different aspects to form a unique or novel solution | **සම්පාදනය කොට ඉදිරිපත් කරන්න**<br>**Compile** | විවිධ මූලාශ්‍රයන් ඔස්සේ එක් රැස්කර ගන්නා තොරතුරු ඒකාරාශී කරමින් ඉදිරිපත් කිරීම.<br>Produce by assembling information collected from various sources |
| | **නිර්මාණය කරන්න**<br>**Design** | සැලසුමකට අනුව ව්‍යුහය හෝ ආකාරය නිර්මාණය කිරීම.<br>Devise the form or structure according to a plan |
| | **ගොඩනගන්න**<br>**Develop** | සැලැස්මක් හෝ අදහසක් හෙලිදරව් කිරීම, අනාවරණය කිරීම, පරිපූර්ණ කිරීම හෝ විහිදා දැක්වීම.<br>To disclose, discover, perfect or unfold a plan or idea |
| | **යෝජනා කරන්න**<br>**Propose** | සලකා බැලීම හෝ අනුගතවීමේ අරමුණ ඇතිව සැලසුමක් නිර්මාණය හෝ හෙළදරව් කිරීම.<br>To form or declare a plan or intention for consideration or adoption |